# අරමුණු හා අභිමතාර්ථ
## ව්‍යාප්තියට අත්වැලක්

**කුලසිරි රණවීර, කෘෂිකර්ම නිළධාරි - රත්නපුර**

**හැඳින්වීම**

සුප්‍රසිද්ධ අධ්‍යාපන මනෝ විද්‍යාඥ "රොබට් මේගර්" පවසන ආකාරයට ඔබ යායුතු ස්ථානය කුමක්ද යන්න ස්ථිරවම ඔබ නොදන්නේ නම් ඔබේ ගමන කෙලවර වන්නේ වෙනත් ස්ථානයකින්ය. එමනිසා ඕනෑම ක්‍රියාවකට එහි අරමුණු සහ අභිමතාර්ථ පැහැදිලිව වෙන්කර ගැනීම ඉතා වැදගත් මූලික අවශ්‍යතාවයකි.

කිසියම් කාර්යයක් ඉටුකිරීමට බලාපොරොත්තු වන ඕනෑම අයෙකුට ඒ සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙලක් තිබිය යුතුය. තමා විසින් කිරීමට අදහස් කරණ කාර්‍යයන් සියල්ල එම වැඩ පිළිවෙල විසින් දක්විය යුතුය. එම වැඩ පිළිවෙලේ කාර්‍යයන් තීරණය වන්නේ තමාගේ මූලික කාර්‍යයේ අරමුණු සහ අභිමතාර්ථයන් අනුවය.

කෘෂිකර්ම ව්‍යාප්ති කාරකයන් වන අප ගොවීන් සමග සහ නිළධාරීන් සමගද විවිධ වැඩ සටහන් ක්‍රියාත්මක කරන්නෙමු. එම වැඩ සටහන් වල සාර්ථකත්වය රඳා පවතින්නේ එහි අරමුණු හා අභිමතාර්ථ පැහැදිලිව වෙන්කරගෙන වැඩ සටහන් සැලසුම් කළහොත් පමණකි. ඕනෑම වැඩ සටහනක අරමුණු මට්ටම් තුනකින් වෙන්කර විස්තර කර තිබේ.

+ **පළමු මට්ටම – අරමුණු හෙවත් පරමාර්ථ**

  කිසියම් ක්‍රියා පද්ධතියක් දීර්ඝ කාලීනව ක්‍රියාත්මක කිරීමෙන් බලාපොරොත්තු වන ප්‍රතිඵලය මෙයින් අදහස් කරයි.

උදා:- සෞඛ්‍ය අධ්‍යාපන ක්‍රියාවලියකින් අනාගතයේ සැමට සුබසෙත සහිත සෞඛ්‍ය සම්පන්න ජන සමාජයක් බලාපොරොත්තු වීම.

+ **දෙවැනි මට්ටම – අභිමතාර්ථ (වර්‍යා අරමුණ)**

  කිසියම් ක්‍රියා පද්ධතියක් ක්‍රියාත්මක කිරීමේදී කෙටි කාලීනව ලබා ගැනීමට අදහස් කරණ ප්‍රතිඵලය වේ.

උදා:- සෞඛ්‍ය අධ්‍යාපන ක්‍රියාවලිය තුළින් ජනතාව තුළ යහපත් සෞඛ්‍ය පුරුදු ඇතිකිරීම

+ **තෙවන මට්ටම – සුවිශේෂ අභිමතාර්ථ (පර්යන්ත අරමුණ)**

  කිසියම් ක්‍රියා පද්ධතියක එක් ක්‍රියාවක් අවසන් වූ වහාම එදිනෙද සහභාගි වන්නන් තුළ ඇති කිරීමට අදහස් කරණ නිශ්චිත වෙනස් කමය.

උදා:- උණු වතුර බීමට ගැනීමේ පුරුද්ද ඇති කිරීම සඳහා කරණ පාඩමක් අවසානයේදී බීමට සුදුසු උණු වතුර යනු කොපමණ වේලාවක් උණුකරගත් වතුරද යන්න සහභාගි වන්නා දැන ගත යුතු බව.

**ව්‍යාප්ති පාඩමක් සැලසුම් කිරීමේදී. . . . .**

ඕනෑම පාඩමක අභිමතාර්ථය පහත පරිදි අවස්ථා 3 කින් සිදුවන බව අධ්‍යාපන මනෝවිද්‍යාඥ "බෙන්ජමින් බ්ලූම්" විසින් පෙන්වා දී තිබේ.

1. ජානක ක්ෂෙත්‍රය (දැනීම)
2. චින්දන ක්ෂෙත්‍රය (ආකල්ප)
3. මනෝචලක ක්ෂෙත්‍රය (කුසලතා)

එමනිසා ගොවීන් සඳහා හෝ නිළධාරීන් සඳහා හෝ කිසියම් පාඨමක් සැලසුම් කිරීමේදී පහත පරිදි අරමුණු හා අභිමතාර්ථ වෙන්කර ගන්න.

උදා:- දහයියා අඟුරු කිරීමේ උපකරණය යොදා දහයියා අඟුරු කර තවාන් වලට යෙදීමේ පාඨමක් ගැන සිතමු.

1. **සුවිශේෂ අභිමතාර්ථ (පර්යන්ත අරමුණ)**

සහභාගි වන්නා තුළ සිදුවිය යුතු චර්යාත්මක වෙනස සඳහා අවශ්‍ය දැනීම - කුසලතා - ආකල්ප - පාඨම අවසන් වූ වහාම ඇති විය යුතුය. එනම් එම උපකරණය සකස් කර ගැනීම එය ක්‍රියා කරවා දහයියා අඟුරු කර ගැනීම හා ඒවා තවාන් වලට යෙදීම යන කරුණු කිරීමට හැකියාව ඇති විය යුතුය., පාඨම සැලසුම් කළ යුත්තේ ඒ අනුවය.

2. **අභිමතාර්ථ (චර්යා අරමුණ)**

පාඩම හෝ වැඩ සටහන අවසන් වීමෙන් පසුව ඔවුන්ගේ හැසිරීම් රටාව වෙනස් වීම සිදුවිය යුතුය. එනම් ඔවුන්ගේ තවාන් වලට දහයියා අඟුරු කර භාවිතා කිරීමේ පුරුද්ද ඔවුන්තුළ ඇති විය යුතුය. පාඩමේ/වැඩ සටහනේ අභිමතාර්ථය ඉටුවුනා වන්නේ එවිටය. මෙම චර්යාත්මක වෙනස ඇති කිරීමට අදාල වන පරිදි පාඩම/වැඩ සටහන සැලසුම් කළ යුතුය.

3. **අරමුණ හෙවත් පරමාර්ථය**

දහයියා අඟුරු යොදා තවාන් යෙදීම නිසා ඊට පෙර තවාන් වල මතුවූ ගැටලු වලින් නිදහස් වී වඩා හොඳ පැළ ලබා ගැනීමට හැකිවීම හා ඒනිසා ඔවුන් ලබන ආර්ථික වාසිය ඔවුන්ගේ ජීවන රටාවේ උසස් බවකට හේතුවීම වැඩ සටහනේ අරමුණයි.
මෙම ක්‍රියාවලියේදී පළමු හා දෙවන අවස්ථාවලදී දැනීම හා කුසලතා පිළිබඳ වෙනස්කම් සිදු කිරීමට විශේෂ අවධානය යොමුවිය යුතුය. ඒවා එසේ සිදුවන විට ආකල්ප පිළිබඳව වෙනස නිතැතින්ම සිදුවන බව "බෙන්ජමින් බ්ලූම්" ගේ මතයයි.

**සටහන**

කෘෂිකර්ම ව්‍යාප්ති අධ්‍යාපනය යනු ගොවි ජනතාවගේ ජීවන හා ආර්ථික මට්ටම උසස් කිරීම සඳහා අරමුණු කරගත් ක්‍රියාවලියකි. ඒ සඳහා ගොවීන් සහ ව්‍යාප්ති කාරකයන් හුරු පුරුදු කිරීමට පාඩම් හා වැඩ සටහන් සැලසුම් කිරීමේදී අරමුණු හා අභිමතාර්ථ නිශ්චය කරගෙන ඒවා සැලසුම් නොකළහොත් අපේ ගමන අවසන් වන්නේ අප යා යුතු තැනින් නොවන බව අප පැහැදිලිව තේරුම් ගත යුතුය.